
අන්තර්ජාලයෙන්




Khufu

# මහා පිරමීඩයේ අභිරහස්

**මහා පිරමීඩයේ අභිරහස් හෙලිදරව් කර ගැනීමට දරන ලද උත්සාහයන් ගැන නැවතත් තොරතුරු මතුවෙමින් තිබේ. මීට පෙර ද නොයෙකුත් අවස්ථාවල නොයෙකුත් උත්සාහයන් දරන ලද අතර, ඒ ඔස්සේ යම් යම් කරුණු අනාවරණය කර ගැනීමට ද, යම් යම් විස්මිත නිර්මාණයන් ගැන තොරතුරු අනුමාන කිරීමට ද හැකියාව ලැබුණු අතර පිරමීඩ සමග වැළලී ඇති අභිරහස් මතු කර ගැනීමට ඒ කිසිදු අධ්‍යයනයක් පූර්ණ වශයෙන් සමත් වූයේ නැත.**





අද්භූත හා ගුප්ත ස්වරූපයේ අත්දැකීම්වලට මුහුණදෙන පර්යේෂණ කණ්ඩායම් බොහෝ අවස්ථාවලදී කිසි දෙයක් කර කියා ගත නොහැකිව දුර්මුඛ වන සිදුවීම් ද පිරමීඩ ගවේෂණ ඉතිහාසයේ අපට දක්නට ලැබෙයි.

අනුමාන කරන ලද සාධක ඔස්සේ අධ්‍යයනයන් මෙහෙයවුණු අතර ඒ අනුව මෙම විශ්වකර්ම ඉදිකිරීම් ගැන සතුටුදායක මට්ටමකට තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ.

පිරමීඩ අභ්‍යන්තරයේ ඇති අභිරහස් පමණක් නොව අද්භූත හා ගුප්ත භාවයන් පිළිබඳ නොයෙකුත් අසාමාන්‍ය අත්දැකීම් පර්යේෂණ කණ්ඩායම්වලට ලැබී ඇති අතර, විද්‍යානුකූල හෝ තාර්කික හේතු දැක්වීම් ඔස්සේ විස්තර කළ හැකි කරුණු පමණක් නොව එලෙස විස්තර කළ නොහැකි කරුණු ද අතිවිශාල සංඛ්‍යාවක් වෙයි.

අද්භූත හා ගුප්ත ස්වරූපයේ අත්දැකීම්වලට මුහුණදෙන පර්යේෂණ කණ්ඩායම් බොහෝ අවස්ථාවලදී කිසි දෙයක් කර කියා ගත නොහැකිව දුර්මුඛ වන සිදුවීම් ද පිරමීඩ ගවේෂණ ඉතිහාසයේ අපට දක්නට ලැබෙයි.

එහෙත් එවන් අද්භූත අත්දැකීම් සෑම විටම පාහේ ගවේෂණ කණ්ඩායම් දිරිගන්වන සුළු ඒවා වන අතර ඒවායේ ගුප්ත ස්වරූපය නිසා ම ගවේෂණය වඩාත් තීව්‍ර, වඩාත් උනන්දු සහගත එකක් බවට පත් කරයි.


එහෙත් ගවේෂණ අතරමග අතහැර දමන්නට සිදුවන ආකාරයේ දැවැන්ත බලපෑම් ඇතිවුණු අවස්ථා ද කොතෙකුත් නැත්තේ නොවේ.


අප අද කථා කරන "මහා පිරමීඩය" (Great Pyramid) තේරුම් ගැනීමට ඉතා අපහසු, විශේෂිත ඉදිකිරීම් විධික්‍රම භාවිත කරන ලද, හේතු නිශ්චිතව ම විස්තර කළ නොහැකි ගොඩනැගිලි නිර්මාණ ක්‍රමයන්ගෙන් සමන්විත, විශිෂ්ඨ නිර්මාණයකි.

මෙම මහා පිරමීඩය කුෆු පිරමීඩය ලෙස හඳුන්වන අතර එය ඉදිකරන ලද භූමියේම තවත් ප්‍රමාණයෙන් කුඩා පිරමීඩ දෙකක් ඉදි කර ඇත.

ඒවා කෆ්රේ පිරමීඩය සහ මෙන්කවුරේ පිරමීඩය ලෙසින් නම් කෙරෙන අතර මෙම පිරමීඩ තුනම අහසේ "ඕරියන්ස් තරු පටිය" මූර්තිමත් වන

**මහා පිරමීඩයේ සැලැස්ම**





**Khufu**

ආකාරයට, පොළොවෙහි නිර්මාණය කරන ලද ඉදි කිරීම් ලෙසට විශ්වාසයක් පවතී.

කෆ්රේ පිරමීඩයට අනුබද්ධිතව සාදන ලද " රාක්ෂසි ප්‍රතිමාව ද" විශිෂ්ඨ නිමැවුමකි. මිනිස් හිසක් ද සිංහ ශරීරයක් ද සහිත මෙම ප්‍රතිමාව ආදි ඊජිප්තු වැසියන්ගේ ගුප්ත විශ්වාසයක ඵලයක් ලෙසින් නිමැවුණකි.

ඊජිප්තුවේ කයිරෝ නගරය ආසන්නයේ පිහිටා ඇති, අද දවසේ ද මහා පිරමීඩය ලෙසින් හැඳින්වෙන විස්මිත ගොඩනැගිල්ල කෙසේ ඉදිකරන ලද්දේ ද යන ප්‍රශ්නය , තවමත් පූර්ණ වශයෙන් පිළිතුරු නොලද ලෙහෙසියෙන් පිළිතුරු සෙවිය ද නොහැකි ප්‍රශ්නයකි. ලක්ෂයක් පමණ කම්කරුවන් වසර 30 ක් මුළුල්ලේ මෙම පිරමීඩය ඉදිකිරීම සඳහා වැඩ කරන ලදැයි, එක අධ්‍යයනයකට අනුව විශ්වාස කෙරේ. තවත් අධ්‍යයනයකට අනුව බලන කල, නයිල් නදිය පිටාර ගලන ජූලි සහ නොවැම්බර් කාලය තුළ ගොවි ජනතාවට ගොවිබිම්වලින් ඉවත්ව සිටීමට සිදුවීම නිසා ඒ කාලවකවානුවේ ද පිරමීඩය ගොඩනැගීම් කටයුතු සිදු කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි වෙයි.

පිරමීඩය සැදීමට අවශ්‍ය ගල්කුට්ටි පහසුවෙන් ගෙන ඒම සඳහා, පිටාර ගැළු ගංවතුර ඉතා හොඳ වාහක මාධ්‍යයක් වන්නට ඇතැයි ද සැලකේ. "අස්වාන්" සහ ටූරා" යන නගර දෙකින් ගෙන ආ බව විශ්වාස කරන මෙම ගල් කුට්ටි, ගං වතුරේ උපකාරයෙන් කෙළින් ම පිරමීඩය ඉදි කරන භූමිය වෙතට ප්‍රවාහනය කළ හැකි විය.

එකක් ටොන් 2 1/2ක් බරැති ගල් කුට්ටි විසි තුන් ලක්ෂයක් (2,300,000) පමණ භාවිත කර ඇතැයි ගණන් බලා තිබේ. පිරමීඩයේ සම්පූර්ණ බර ටොන් ලක්ෂ හැටක් (6,000,000) පමණ වෙතැයි සැලකේ. අඩි 482 ක් උස මෙම "මහා පිරමීඩය" ගීසා හි විශාලම හා පැරණි ම ඉදි කිරීම යි.

මෙම දැවැන්ත ඉදිකිරීම සංවිධානය කළ ශ්‍රේෂ්ඨයා කවුරුද?


ඔහු "කුෆු "රජු යි.

පිරමීඩ සාදන්නකු ලෙසට ප්‍රසිද්ධියක් ඉසිලූ "ස්නෙෆෙරු" රජුගේ පුත්‍රයා වන "කුෆු " රජුගේ මව "හෙතෙෆෙරෙස්" වූවා ය.

මහා පිරමීඩය ඉදි කළ කුෆු රජුයේ පියා වන මෙම "ස්නෙෆෙරු" රජු ජනතාවට හිතකාමී කරුණාවන්ත රජකු ලෙසින් සැලකුම් ලැබී ය. තම ජනතාවට සමීප, ඔවුන්ගේ ඕනෑ එපාකම් හොඳින් සොයා බැලූ, එමෙන්ම ජනතාවගේ සුබසාධනය ගැන වඩාත් අවධානයක් යොමු කළ "ස්නෙෆෙරු ' ජනතාව අතර හොඳ හිත දිනා ගත් රජකු විය.

එහෙත් ඔහුගේ පුතුගේ ස්වරූපය ඊට හාත්පසින් ම වෙනස් විය. කුෆු රජු ඉතාමත් දැඩි පාලකයෙක් විය. මහා පිරමීඩයේ නිර්මාපකයා වන ඔහු ගැන එතරම් තොරතුරු අද දවසේ සොයා ගත නොහැකි වේ.

මන්ද යත් පුරාවිද්‍යා ගවේශකයන්ට වඩා නිදන් හොරු ඉක්මන් මෙන් ම දක්ෂ ද වූ බැවින්, තොරතුරු මතු කර ගත හැකිවූ බොහෝ බඩු භාණ්ඩ හොරුන් විසින් පිරමීඩයෙන් පිටතට ගෙන ගොස් තිබිණ.




ජීවත්ව සිටියදී තමන් භෞතිකව ස්පර්ශකරන ලෝකයෙන් එපිටවූ, ආත්මීය බලවේගයන් සහිත වු ගුප්ත ලෝකයක පැවැත්ම ගැන අතිශයින් විශ්වාස කළ,

තමාගේ මරණින් මතු එම ලෝකයට පිය මං කර එහි ආත්මීය බලවේගයක් ලෙස සදකල්හි ම පවතින්නට අතිශයින් තෘෂ්ණාධික වූ ආශාවකින් මඬනා ලදුව,

එම අතෘප්ති කර ආශාව , අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තම ජීවිත කාලයම කැප කළ, එමෙන් ම තම රටේ බහුතර ජනතාවගේ ශ්‍රමය සහ කාලය ඒ වෙනුවෙන් කැපකරවා ගත්තා වූ,

එනිසාම මෙවන් විස්මය ජනක ඉදිකිරීම් කරන්නට හැකියාව ලැබුවාවූ, පාරාවෝ රජවරුන්ගේ අද්භූත නිර්මාණයන් හි අරුත,

විද්‍යාව හා තාක්ෂණය මෙතරම් දියුණුව ඇති අද දවසේ වුවද, අපට නිවැරදිව විවරණය කර ගත හැකි වේවිදැයි සැක සහිත ය.



**Khufu**

පුරාවිද්‍යා ගවේශකයන් පිරමීඩයට ඇතුළු වීමට බොහෝ කලකට පෙර තිදත් හොරු තම ගවේෂණ අවසන් කොට ප්‍රතිඵල ද රැගෙන පිටත්ව ගොස් තිබූ නිසා, පුරා විද්‍යා ගවේෂකයන්ට සිදුවූයේ හොරුන්ගේ අනුකම්පාව මත ඉතිරිව තිබූ භාණ්ඩ ඔස්සේ ඉතිහාසය ගොඩ නැගීමට යි.

ඉතිරිව ඇති තොරතුරු අනුව වුවද කුෆු රජු අති ප්‍රබල, දක්ෂ රජකු බව තහවුරු වෙයි.

ඉතාමත් ඉහළ මට්ටමින් ව්‍යුහගතව තිබූ සමාජයක දක්ෂ පාලකයකු වූ හෙතෙම බොහෝ සෙයින් ධනවත් විය.

පියා මෙන් නොව කුෆු රජු සිත්පිත් නැති කෲර පාලකයකු ලෙස හඳුන්වනු ලැබෙයි ඔහුගේ කෲරකම් පිළිබඳ සත්‍යාසත්‍යතාව කෙසේ වුවද හෙතෙම කටයුතු සංවිධානයේ සහ මිනිසුන් පාලනයේ ද, වැඩ ගැනීමට ද, දක්ෂයකු විය.

ගීසා හි මහා පිරමීඩය පමණක් නොව එහි පරිවාර අනෙකුත් ස්මාරක හා ඉදිකිරීම් ද කිරීමට අතිවිශාල වූ මිනිස් බලයක් සහ අමුද්‍රව්‍ය පුමාණයක් අවශ්‍ය වූ අතර ඒවා සපයා ගැනීමේ ද, මනා ලෙස කළමනාකරණය කර ගැනීමේ ද, විශිෂ්ඨ වූ හැකියාව කුෆු රජු සතු විය.

එපමණක් ද නොව පියා වන ස්නෙෆෙරු රජුගේ පිරමීඩ ව්‍යාපෘතිවල වැඩ කිරීම නිසා ඔහු ඉදි කිරීම් කටයුතු ගැන මනා අවබෝධයක් ඇතිව සිටියේ ය. එනිසාම වඩාත් හොඳ, වඩාත් සාර්ථක, වඩාත් නිර්මාණශීලී, ඉදිකිරීමකට ඔහුට හැකියාව ඇති විය. පිරමීඩ ව්‍යාපෘතිවලින් ලද දැනුම සහ අභාෂය ඔහුට බෙහෙවින් ඉවහල්වූ බව පෙනේ.

තමාගේ යටත් සේවකයින් අතර මනා සංවිධානයක්, සම්බන්ධීකරණයක්, පවත්වා ගැනීමට ද, නිසි නායකත්වය දීමට ද, ඔහුට හැකිවූ බව සහ ඔහුගේ දැඩි බව ඊට මහත් රුකුලක් වූ බවට ද නොයෙකුත් සාක්ෂි ලේඛනවලින් සොයා ගත හැකි වෙයි.

නවතම සොයා ගැනීම්වලට අනුව මෙම පිරමීඩය වහල් ශ්‍රමය භාවිතයෙන් ඉදි කරන ලද්දක් නොවේ. එකල මුදල් භාවිතය හීන වූ බැවින්, ජනතාවගෙන් අය කරන ලද බදු ද, ද්‍රව්‍ය සහ සේවාවන් ලෙසින් ගෙවීමට නියම කෙරිණි. එසේ ලබා ගත් ද්‍රව්‍ය සහ සේවාවන්ගෙන් පිරමීඩ ව්‍යපෘතියේ කටයුතු සිදු කෙරිණ,

නයිල් නදිය පිටාර ගලන කාලයේදී පිරමීඩයේ වැඩ සඳහා යොද ගත් ගොවි කම්කරුවන්ට වැටුප් වශයෙන් ගෙවනු ලැබුයේ ඔවුන්ගේ දෛනික ආහාර වේල් පමණි.

පිරමීඩය සෑදීමට වසර 23ක් (ක්‍රි.පූ.2589 – ක්‍රි.පූ. 2566) ගතවිණැයි සැලකේ.

භූමියෙන් අක්කර 13 ක පමණ විශාල ප්‍රදේශයක් වසා පැතිරෙන පිරමීඩය උසින් අඩි 481 ක්ද , පැත්තක දිග අඩි 754ක් ද, වෙයි.

එහෙත් කාලයාගේ ඇවෑමෙන් පිරමීඩයේ වූ පිටත ආවරණ ගල් කුට්ටි ගලවා ගැනීම හා ස්වභාවිකව ගැලවී යාම නිසා උස අඩි 30 කින් එනම් අඩි 450 දක්වා අඩු වී ඇති අතර පැත්තක දිග ද අඩි 9 කින් එනම් අඩි 745 දක්වා අඩු වී ඇත.

මේ සියලු ක්ෂය වීම් හමුවේ වුවද පිරමීඩයේ දැවැන්ත බව තවමත් එලෙසින් ම පවතී. පොළොවේ සිට අංශක 51 ආනතියකින් අහසට එසවෙන පිරමීඩයේ පැති සහ අනෙකුත්


මෙහි අතිශය ගුප්තමය බවක් කැටි වී ඇති නොවිසඳුණු අභිරහස වී ඇත්තේ පිරමීඩය තුළ ඇති කුටීර වලින් පිටතට දිවෙන "වායු දඬුයි" දඬු ලෙස සැලකුව ද ඒවා දිග සිහින් "වායුනල"ලෙසින් හැඳින්විය හැකි වෙයි. හතරැස් හරස්කඩකින් යුත්තව ඉතා දිගින් යුතු මෙම වායු දඬු කවර හේතුවක් නිසා නිර්මාණය කරන ලදදැයි තවමත් නිශ්චිතව සොයා ගැනිමට නොහැකි වී ඇත.

මෙහි නිර්මාණයේ විස්මිත කාරණය වන්නේ මෙම වායු නල දිවෙන රේඛාවන් දෙක පසුපසට දික් කළොත් එය රජ කුටීරය හරි මැදින් ඇදෙන සිරස් රේඛාව සමග හරියටම සම්පාත වීම යි.


සියලුම ඉදි කිරීම් නිරවද්‍ය වූ ගණිතමය සුළු කිරීම්වලට ( mathematical calculations) අනුකූලව ම නිමවා ඇති අයුරු විස්මයජනක ය. මෙහි අතිශය ගුප්තමය බවක් කැටි වී ඇති නොවිසඳුණු අභිරහස වී ඇත්තේ පිරමීඩය තුළ ඇති කුටීර වලින් පිටතට දිවෙන "වායු දඬුයි". (air shafts)

දඬු ලෙස සැලකුව ද ඒවා දිග සිහින් "වායුනල"ලෙසින් හැඳින්විය හැකි වෙයි. හතරැස් හරස්කඩකින් යුත්තව ඉතා දිගින් යුතු මෙම වායු දඬු කවර හේතුවක් නිසා නිර්මාණය කරන ලදදැයි තවමත් නිශ්චිතව සොයා ගැනිමට නොහැකි වී ඇත.

පිරමීඩය තුළ ප්‍රධාන කුටීර තුනක් වෙයි. රජ කුටීරය, බිසෝ කුටීරය, සහ පොළොව යට පිහිටි තෙවන කුටීරය යන මේ කුටීර තුන විශේෂිත අයුරින් නිමවා ඇත.



## "ගීසා" හි මහා පිරමීඩයේ හරස්කඩ




රජ කුටීරය කුෆු රජුගේ සිරුර සහ භාවිත ආම්පන්න, භාණ්ඩ තැන්පත් කිරීමට ද, බිසෝ කුටීරය, රජ බිසවගේ සිරුර, ඇයට අයත් භාණ්ඩ තැන්පත් කිරීමට ද සාදන ලද ඒවා විය.

මෙම කුටීර පිරමීඩයේ පහළ කොටසෙහි සාදන ලද මනා ලෙස නිම කළ කාමර වන අතර තුන්වන කුටීරය පාදමෙන් යට (පොළොව කැන) සාදන ලද, එහෙත් වැඩ නිම නොකළ යම් විශේෂිත කාමරයක් වෙයි.

රජ කුටියේ සිට පිටතට පෙළොවට සමාන්තරව දෙපසට දිවෙන වායු නල දෙක යම් කෙටි දුරක් තිරස්ව (Horizontally) ගිය පසුව ඉහළට ආනති වී දීර්ඝ දුරක් ගමන් කර පිරමීඩයේ උතුරු සහ දකුණු පැති දෙකින්, මුදුනට ආසන්න ස්ථානයකින් පිටතට විවෘතව නවතී. රූප සටහන

මෙහි නිර්මාණයේ විස්මිත කාරණය වන්නේ මෙම වායු නල දිවෙන රේඛාවන් දෙක පසුපසට දික් කළොත් එය රජ කුටීරය හරි මැදින් ඇදෙන සිරස් රේඛාව සමග හරියටම සම්පාත වීම යි. රූප සටහන බලන්න.

බිසෝ කුටීරයේ ද මෙලෙසින් ම නිර්මාණය කළ වායු නල දෙකක් පිරමීඩයේ මතුපිටට දිවෙන අතර එම රේඛාවන් පසුපසට දික් කළ විට බිසෝ කුටීරය මැදින් ඇඳුන සිරස් රේඛාවට හමු වෙයි.

මෙය විශිෂ්ඨ ගණිතමය නිර්මාණයකි.

රජ කුටීරයේ සිට දිවෙන වායු නල පිරමීඩයෙන් පිටත අවකාශයට විවෘතව ඇති නමුත් බිසෝ කුටීරයෙන් යන වායු නල පිටත ආකාශය විවෘත නොවන සේ කෙලවර වසා තිබේ. ඒ ඇයිද යන්න ද තවම විසඳී නොමැති ගැටළුවකි.

පොළොව යට පිහිටි තෙවන කුටීරයට මෙවන් වායු නල නැති නමුත් ඊට සමාන වායු කොරිඩෝවක කොටස් තැන තැන දැකිය හැකි ය.

රජ කුටීරයෙන් උතුරු දිශාවට දිවෙන වායු නලයේ හරස්කඩ දිග පළල 7" x 5" වන අතර අංශක 31 ක ඉහළ ම ආනතියකින් යුතුව අඩි 235 ක් දිගට ද ඇදී පිරමීඩයේ පිටත පෘෂ්ඨය සමග සම්බන්ධ වෙයි. දකුණු දිශාවට දිවෙන නල හරස්කඩ 8"x12" වන අතර ඉහළට ආනතිය අංශක 41කි. දිග අඩි 175 ක් වෙයි.

මෙම "වායු නල" ඔස්සේ ගමන් කළ හැකි "රොබෝ යාත්‍රිකයකු" පිරමීඩ ගවේශකයන් විසින් නිර්මාණය කරන ලද අතර නොයෙකුත් තාක්ෂණික උපාංගවලින් සමන්විත එම"යාත්‍රිකයා" මේ වායු දඬු ඔස්සේ ඉහළට ඇවිද ගොස් නොයෙකුත් තොරතුරු ලබා දී තිබේ.

එහෙත් තවමත් අභිරහස් විසඳී නොමැත. මෙම වායු නල , පිරමීඩය අභ්‍යන්තරයට අවශ්‍ය වාතාශ්‍රය සැපයීම සඳහා නිර්මාණය කරන ලදැයි මතයක් ඇත.

එසේ වුවද මේ වායු දඬු අවකාශයට එල්ල වී ඇති ආනතීන් ගැන පර්යේෂණ කළ තාරකා විද්‍යාඥයින් පවසන්නේ ඒවා යම් යම් තරු පංතීන් එල්ලකර ගෙන නිර්මාණය කරන ලද ඒවා බව යි.

ගණිතමය වශයෙන් අතිශයින් නිරවද්‍යතාවක් සහිතව ඍජු එල්ලයකින් මෙම වායු දඬු නිර්මාණය කරන්නට ඇත්තේ වාතාශ්‍රය ලැබීමට යැයි සිතීම සැබැවින් ම දුර්වල අදහසක බව හැඟෙන්නේ එවිට යි.

කුෆු රජුගේ ආත්මයට විශ්වයේ තරු පංතීන් හා එක්වීමට අවකාශ සැලසීම් වස් "වාදඬු" නිර්මාණය කරන ලදැයි ඇති වී ඇති මතය බෙහෝ දුරට නිවැරදි යැයි සැලකිය හැකි වෙයි.

කවර මතයක් නිවැරදි දැයි නිත්‍ය වශයෙන් තහවුරු කළ නොහැකි යි. තව තවත් මතු කර ගත යුතු කරුණු කාරණා ද රහස් හා අභිරහස් ද බොහෝ වෙයි.

ජීවත්ව සිටියදී තමන් භෞතිකව ස්පර්ශ කරන ලෝකයෙන් එපිට වූ, ආත්මීය බලවේගයන් සහිත වූ ගුප්ත ලෝකයක පැවැත්ම ගැන අතිශයින් විශ්වාස කළ,

තමාගේ මරණින් මතු එම ලෝකයට පිය මං කර එහි ආත්මීය බලවේගයක් ලෙස සදාකල්හි ම පවතින්නට අතිශයින් තෘෂ්ණාධික වූ ආශාව මඬනා ලදුව,

එම අතෘප්ති කර ආශාවකින්, අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තම ජීවිත කාලයට කැප කළ, එමෙන් ම තම රටේ බහුතර ජනතාවගේ ශ්‍රමය සහ කාලය ඒ වෙනුවෙන් කැපකරවා ගත්තා වූ,

එනිසාම මෙවන් විස්මය ජනක ඉදිකිරීම් කරන්නට හැකියාව ලැබුවාවූ, පාරාවෝ රජවරුන්ගේ අද්භූත නිර්මාණයන් හි අරුත,

විද්‍යාව හා තාක්ෂණය මෙතරම් දියුණුව ඇති අද දවසේ වුවද, අපට නිවැරදිව විවරණය කර ගත හැකි වේවිදැයි සැක සහිත ය. ❑

**ධර්මානන්ද විජේසිංහ**